පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.14 පැය 1340 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 61 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු

### 01. මාරක රිය අනතුරක් - තණමල්විල පොලිස් වසම.

2025.01.14 වන අද දින අළුයම් කාලයේ තණමල්විල පොලිස් වසමේ තණමල්විල උඩවලව ප්‍රධාන මාගර්යේ 25 කණුව ප්‍රදේශයේ තණමල්විල දෙස සිට උඩවලව දෙසට ධාවනය වූ බස් රථයක් හා ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරු පැදියක් එකිනෙක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත.

අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු ප්‍රතිකාර සඳහා තණමල්විල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තණමල්විල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර තණමල්විල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - නින්දවූර් පොලිස් වසම.

2025.01.13 වන දින දහවල් කාලයේ නින්දවූර් පොලිස් වසමේ මාට්ටුපාලම් ප්‍රදේශයේ පුද්ගලයෙකු ආලිඅඩි පාලමෙන් වැටී දියේ ගිලී මියගොස් ඇති බවට නින්දවූර් පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වූ නින්දවූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු බිරිඳ සහ දරුවා සමඟ සමග විනෝද චාරිකාවක් සඳහා යතුරු පැදියකින් පැමිණ ඇති අතර පාලමෙන් එගොඩවීම සඳහා මරණකරු පමණක් යතුරු පැදියෙන් යමින් සිටියදී යතුරු පැදිය ඇලට පෙරළීමෙන් මෙම අනතුර සිදු වී ඇති බවට විමශර්නයේදී අනාවරණය වී ඇත. මෘතදේහය හදිසි මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාර දී ඇත. නින්දවූර් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 03. දියේ ගිලී කුඩා දැරියක් මියයාම - එරාවූර් පොලිස් වසම.

2025.01.13 වන දින සවස් කාලයේ එරාවූර් පොලිස් වසමේ මක්කාමඩි පාර, එරාවූර් ප්‍රදේශයේ දී කුඩා දැරියක් ජලය සහිත ළිඳකට වැටී මියගොස් ඇති බවට එරාවූර් පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මිය ගිය දැරිය අවුරුදු 02 මාස 02 ක් වූ මක්කාමඩි පාර, එරාවූර් ප්‍රදේශයේ පදිංචිව සිටි දැරියකි.**

දැරිය පමණක් නිවසේ සිටි අවස්ථාවකදී නිවස ඉදිරිපිට ඇති ජලය සහිත ලිඳට වැටීමෙන් මෙම මරණය සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නය අනුව අනාවරණය වී ඇත. මෘතශරිරය හදිසි මරණ පරීක්ෂණයෙන් පසු ඥාතින්ට භාර දී ඇත. එරාවූර් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**